# මැතිවරණ කොමිෂන් සභාව
# தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය: 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல்: 011-2868426

web : www.elections.gov.lk e-mail : info@elections.gov.lk

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය(10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம
சரண மாவத்தை, இராஜகிரிய(10107)


මගේ අංකය: TR/PE/01/2020 ඔබේ අංකය : දිනය : 2020.06.19
எனது இல. உமது இல. திகதி

**චක්‍රලේඛ අංක TR/2020/04**

**සියළුම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් සහ**
**නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05</u>**
**<u>තැපැල් හා පොලිස් දෙපාර්තමේන්තුවට වාහන ලබාදීම.</u>**

ඉහත ඡන්ද විමසීමට අදාළ නිල ඡන්ද දැන්වීම්පත් බෙදාහැරීම පිණිස තැපැල් දෙපාර්තමේන්තුව සතු වාහන ප්‍රමාණවත් නොවිය හැකි හෙයින් එම කාර්යය ඉටු කර ගැනීම සඳහා රජයේ වාහන කිහිපයක් ලබාදෙන ලෙසට ඔවුන් ඔබෙන් ඉල්ලා සිටියහොත් ඒ සඳහා ඔබගේ දිස්ත්‍රික්කයෙන් රජයේ වාහන කිහිපයක් ලබාදීමට කරුණාකර කටයුතු කරන්න. එසේ ලබා දෙන **<u>වාහන වලට සපයනු ලබන ඉන්ධන සඳහා වන වියදම් තැපැල් දෙපාර්තමේන්තුව විසින් දැරිය යුතුය. එම රියදුරන්ගේ අතිකාල හා සංයුක්ත දීමනා ආදී ගෙවීම් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල විසින් කළ යුතුය.</u>** මෙම ඡන්ද විමසීමට අදාළව තැපැල් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන රාජකාරී සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ඉදිරියේදී ඔවුනට වෙන්කර දෙනු ඇත.

02. මෙම ඡන්ද විමසීමේදී ආරක්ෂක රාජකාරී ඉටුකිරීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුවට ද වාහන සැහෙන සංඛ්‍යාවක් අවශ්‍ය වන හෙයින් ඔවුන් විසින් ද රජයේ වාහන ලබා ගැනීම පිණිස තේරීම්භාර නිලධාරීන් වෙත ඉල්ලීම් ඉදිරිපත් කරනු ඇත. එවැනි අවස්ථාවන්හිදී ඔබගේ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීමේ කටයුතු සඳහා ප්‍රමාණවත් වාහන සංඛ්‍යාවක් තිබේ නම් පමණක් රජයේ වාහන කිහිපයක් පොලිස් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය සඳහා ලබාදීමට කටයුතු කළ හැකිය. එසේ වාහන ලබාදුනහොත් ඡන්ද විමසීම නිමාවී දින 03 ක් ගතවීමට මත්තෙන් අදාළ වාහන ආපසු එම ආයතන වෙත භාරදීමට ද ක්‍රියා කළයුතු බවට ඔවුන්ව දැනුවත් කරන්න. මෙසේ ලබාදෙන **<u>වාහන වලට අවශ්‍ය ඉන්ධන වියදම් පොලිස් දෙපාර්තමේන්තුව විසින් දැරිය යුතු අතර, රියදුරන්ගේ අතිකාල හා සංයුක්ත දීමනා ආදී ගෙවීම් අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය මගින් කළ යුතුය.</u>**

03. තවද පොලීසියට අවශ්‍ය වාහන පොලිස්පතිවරයාගේ අනුමැතියට යටත්ව *කුලී පදනම මත ද ලබාගත හැකිඅතර කුලී පදනම මත වාහන ලබාගැනීමේ චක්‍රලේඛයේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ඔවුනට පෞද්ගලික වාහන ද ලබාගත හැකිය. *(චක්‍රලේඛ අංක TR/2020/05 බලන්න.)

04. **ඡන්ද විමසීමේදී පොලිස් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා සඳහා ලබාගන්නා පෞද්ගලික වාහන ධාවනයට එක්කිරීමට ප්‍රථම ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කළයුතු අතර අවශ්‍යතා අනුව හා සුදුසු වාහන තෝරා ගැනීම පොලිස් දෙපාර්තමේන්තුවට කළහැකි වේ.** ඡන්ද විමසීම අවසන්වීමෙන් පසු පොලිස් දෙපාර්තමේන්තුව මගින් ලියාපදිංචි කරන ලද වාහන වල තොරතුරු අඩංගු වාර්තාවක් අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය හරහා මැතිවරණ මහලේකම් කාර්යාලයේ අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත එවිය යුතු වේ. පොලිස් දෙපාර්තමේන්තුව වෙත මීට අදාළ ප්‍රතිපාදන වෙන් කරන විට මෙම වාර්තාවට අනුව කටයුතු කරන බවද දන්වා සිටිනු කැමැත්තෙමි.

05. ශ්‍රී ලංකා යුධ හමුදාව කිසියම් කාර්යයකට කැඳවන්නේ නම් එසේ කරනු ලබන්නේ පොලිස් දෙපාර්තමේන්තුවේ සහාය සඳහාම වන බැවින් හමුදා අවශ්‍යතා සඳහා සපයනු ලබන වාහන සඳහා වන සියළුම ගෙවීම් පොලිස් දෙපාර්තමේන්තුව විසින් කළයුතු වේ.

**සමන් ශ්‍රී රත්නායක ,**
මැතිවරණ කොමසාරිස් ජනරාල්.
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි).

**පිටපත්** : 01. විගණකාධිපති

02. තැපැල්පති, තැපැල් මූලස්ථානය } - සියළුම ප්‍රාදේශීය තැපැල් අධිකාරීවරුන් සහ අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කාරුණිකව

03. පොලිස්පති, පොලිස් මූලස්ථානය. } - දැනගැනීම සඳහා හා අදාළ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා කාරුණිකව.

04. හමුදාපති, හමුදා මූලස්ථානය

05. ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව

06. අතිරේක මැතිවරණ කොමසාරිස් ( ජාතික මැතිවරණ) ඇතුළු ප්‍රධාන කාර්යාලයේ සියළු මාණ්ඩලික නිලධාරීන් හා ශාඛා ප්‍රධානීන්

07. ප්‍රධාන මූල්‍ය නිලධාරී - අවශ්‍ය කටයුතු සඳහා

08. ප්‍රධාන අභ්‍යන්තර විගණක - අවශ්‍ය කටයුතු සඳහා


| | | |
|---|---|---|
| **සභාපති** | **සහකාර මැතිවරණ කොමසාරිස් )පාලන(** | **පරිපාලන නිලධාරි** |
| தவிசாளர் | உதவித் தேர்தல்கள் ஆணையாளர் (நிருவாகம்) | நிருவாகஅலுவலர் |
| දුරකථන/தொலைபேசி : 011-2868444 | දුරකථන/தொலைபேசி:011-2868450 | දුරකථන/தொலைபேசி: 011-3083371 |
| ෆැක්ස්/ தொலைநகல்: 011-2868445 | ෆැක්ස්/தொலைநகல் : 011-2868450 | ෆැක්ස්/தொலைநகல் :011-3083371 |
| *e-mail :chairman@elections.gov.lk* | *e-mail : admin@elections.gov.lk* | *e-mail : info@elections.gov.lk* |